දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2014 පරීක්ෂණය - 2017 ඔක්තෝබර්
Bachelor of Arts General (External) Degree Part II 2014 Examination – October 2017

# සිංසා 3.1 - සම්භාව්‍ය සිංහල ගද්‍ය කාව්‍යය
# SLG 3.1 - Classical Sinhala Prose

කාලය පැය තුන යි

**පළමු වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**
**නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩුවිය හැකිය**

---

01. I. පහත දැක්වෙන ඡේද වත්මන් සිංහලයට නගන්න.
II. ඉරි ඇඳි පදවලට විවරණ සපයන්න.

(අ) සොර දු එ සමාහි දුබ්භොජනයෙනුදුදුක්ඛසෙය්‍යායෙනුදු උකටලි වී. ඔහු මැරූ මිනිස්හු එකක්හු උනු දහසක් දෙන යැ. හෙ වනාහි "එකකු විසින් දහස සපිරෙ" යි යන සිත් ඇති වැ "යමක්හු පළමු දිටිම් ද, ඔහු මරා ගණන් සපුරම්. ශිල්පයට උපචාර කොටැ දැළි කප්වා නහා පිළි පෙරළා මවුපියන් දක්මි"යි අටවියට වදනා තැනට අවුදු මඟින් පහ වැ සිටියෙ, බුදුන් දැකැ විස්මිත වැ "මෙ මඟට පුරුෂයො දස දෙන දු විසි තිස් සතලිස් පනස් දෙන දු සැක ඇති වැ සන්නඬ වැ වග වග වැ එති. ඔහු දු මා අතැ නස්ති. එතෙකුදු හොත් මෙ මහණ එකලා වැ මා අභිභවමින් මෙන් එයි. මෙ මහණහු මැරුව මැනැවැ"යි කඩු පලඟ ගෙනැ දුනු හියවුර බැඳැ බුදුන් පස් පස් ලුහුබඳවමින් යෙයි. යම්සෙ අඟුල්මල් සොර බුදුන් පියෙවිගමනින් වඩනුවන් බැලපමණින් දිවෙනුයෙ හඹා නො ගත හෙ ද, එ වැනි අධිෂ්ඨානයක් කොළෙ. කිසෙ යැ යත්: "මහපොළොව නැඟි නැඟී බස්නා රළ සෙයින් උහු ඇරැ බහ බහා සිටිවයි. හි-සනක් පමණ තැන් පියා යෙයි. ගිය කලැ බුදුහු පෙරට මහත් අඞ්ගණයක් දක්වා තුමුහු මධ්‍ය වෙති. හෙ අන්ත්‍ය වෙයි. 'දැන් මොහු හඹා-ගන්මි'යි බැල පමණින් දිවෙයි. බුදුහු එ අඞ්ගණයෙහි කෙළවරැ වෙති. සොර මධ්‍යයෙහි වෙයි. හෙ "මෙ තැනැ දී ඔහු හඹා-ගන්මි"යි වෙළෙවි වැ දිවෙයි. බුදුහු එහි පෙරට වළක් හො ගොඩක් හො දක්වති. මෙ නියායෙන් ඔහු තුන් යොජනක් තැන් ගෙනැ වැඩියො.

(අමාවතුර, කෝදාගොඩ ඤාණාලෝක හිමි. සංස්)

(ආ) ඉඳුරා නිශ්චල කොටැ මරා හෙළාලු ඇස් සඟළෙකැ: සියලු ලොව මිල කරත් හොත් මෙ මැ වැඩියෙකැ. රන්වන් පළල් දෙ බැම මැද පැනෙන ඌර්ණරොමධාතුවෙකැ: එ රන්වන් පියුමෙකැ බමරවැළ දෙකක් මැද හුණු රාජහංසයකු උපමා කරත් හොත් මා හා සුදුසු උපමා නො දන්නො නැත. උතුරුසයුරු මත්තෙන් නැඟෙන්නට පටන්-ගත් පිරුණු සඳ-මඬල උපමා කෙරෙම් නම්, එ බැම සඟළ වැනි දැයෙක් එහි නැත. නිමිල වූ ඌර්ණරොමධාතුවට කවර උපමාවෙක් ඇද්ද රන්ගල් අතලෙකැ නිල් වූ තමලු ලිය සඟළක් මැද හටගත් සුදු වූ ලවලී ලියක් කියත් හොත් මෙ මැ උපමා නො වෙයි. මුළාවන් කෙරෙහි අග්‍ර නියා යැ, 'එක් සබා බසක් කීවන් දෙ තුඬු ලැබෙතී' කියා යැ: සසර පමණින් බොරුවක් තුඬ නො පැහැරැ සබා මැ කී පිනින් සකසා ලත් එ මනහර තුඬ කා ගෙ බසින් සැරැහී නිමා ද? සියලු තුන් ලොව මිල කළ බවට තුන්පිටකය නිඃශෙෂයෙන් දත් බවට, ඇඳි සලකුණු හිරි තුනක් වැනි වූ හිරි තුනෙකින් හොබනා මට වට වූ කර අප සෙ වූවන් ගෙ බසට බිම් නො වෙයි. සියලු ලොකයට අභය අත් දෙනු පිණිසැ සැරැහී සිටි දැතෙක. එ දෙ අත කවරෙක් නම් කියා නිමවන්නෙ ද; පබුළු මුහුදු මහරළ සිසාළ, රන්ගලක් සෙ ඉතා රත් වූ සිවුරින් වසන ලද එ රන්වන් ශරීරය වර්ණනා කොටත් සිතිනුත් සිතන්නෙම් වෙන වෙන මැ ලොව සදාලත් හොත් පොහොසත් වූ අනන්ත වූ පාරමිතා සම්භාරයො අටළොස්රියන් පමණ ශ්‍රී ශරීරය 'මම් යැ. මම් යැ'යි කියා සදාලූහ. එසෙ වූ රූපකාය කවරෙක් නම් කියා නිමවා ද?

(බුත්සරණ, ලබුගම ලංකානන්ද හිමි. සංස්)

(ඇ) ළදරුවාණෙනි, යම් සේ මහත්ව ඇවිලෙන ගින්නක් දුක සත්පුරුෂ කෙනෙක් මේ ගිනි මෙසේ ඇවිළ ඇවිළ තිබිලා ගම්වල ගෙවල වැද ගෙන ගම් ගෙවල් දවා පියා නමුත් බල බලා යාම තරම් නො වන්නේ වේ දැයි පැනක් හිස, නිවා පියත් ද එ පරිද්දෙන් මාගේ සන්තානයෙහි දරු සෝක නැමැති ගින්න වැද ගෙන අදහස් නැමැති ගම් ගෙවල් දවනුවා තෙපි තොපගේ අනුශාසනා නැමැති පැනින් නිවා පුව. නැවත ශෝක නැමැති ශරයෙන් විත් කාපු මා තෙපි තොපගේ නුවණ නැමැති අතින් සෙමෙන් සෙමෙන් ශෝක ශරය හරා පියා අනුශාසනා නමැති බෙහෙදින් අදහස් නමැති සැර පහරට බෙහෙත් කොට සුව කළව. එසේ හෙයින් තොපගේ මාලුකම පිහිටා මෙවක් පටන් දරු සෝක නො කරමි. වියෝගය සරි වුවත් උන් ශෝක නොකරන කල මා කරන ශෝකයෙන් වන්නේ ශරීරය වියැළෙන පමණෙක. කථාව කරන කල කාරණ නො සැළකෙතත් පසුව සලකන කලට නුවණැත්තවුන්ට යහපත්ව හැඟෙයි. මටත් අනුශාසනා අසා හැම ම සැලකිණ. යම් කෙණෙක් පෙර පුරුදු කමක් නැති ව අමුතුව ලා සහායක් වූ නම්, උන් හැඳින්න මැනව. එසේ හෙයින් තෙපි කවුරු ද යි විචාළෝය. ඒ අසා දේවතාවාණෝ යම් කෙනෙකුන් අරහයා තෙපි හඬවූ නම් ඒ තොපගේ මළ පුතණුවෝ නම් මමය. ගොසින් දෙව්ලොව උපනිමි'යි කිවුය.

(සද්ධර්මරත්නාවලිය, ප්‍රාචීන භාෂෝපකාර සමිතිය. සංස්)

(ඈ) එකෙණෙහි ඒ පුරුෂයෝ ද එම්බා රාජ කුමාරයෙනි, මේ ලෝකයෙහි සත්ත්වයන් සිත් අලවන ක්‍රීඩා නමුත් මේ ය. ස්ත්‍රීහු යයි කියන්නෙත් මොවුන්ට යයි ඉදින් මේ ගීතිකායෙහි තොපගේ සිත් ඇලේ නම්, ශබ්ද රසයෙන් සැප වුව මැනවැ යි කීවාහුය. ඒ අසා රාජකුමාර තෙම ස්ත්‍රී යයි යන බසින් සමීපයට කැඳවා එසේ වී නම් ධාන්‍යාගාරය සමීපයට අවුත් ගායනා කරන්ට කියව'යි සම්මත කෙළේ ය. තොමෝත් භිත්ති සමීපයෙහි සිට ගායනා කොට, ඔහුගේ සිත් තමා වසඟයෙහි ලා ගෙන සමීපයට කැඳවූ කල්හි, ඕ තොමෝත් මාගේ මනදොළ මුදුන්පත් වන්නේ යි සිත් ඇති ව, පුළුලුකුල කෙළනා මිණිමෙවුල් දම් හා කොකුම් රාග තැවරූ මතුයෙහි කෙළිනා මුතුහරින් හා කොපුලන ළෙල දෙන, මිණිකොඬලින් යුක්තව ධ්‍යානලාභීන් වී නමුත් සිත් අවුල් කරන තරම් රූප විලාස ඇති ව ඒ ධාන්‍යාගාරයට වැද බෝධිසත්වයන් හා එක්ව යහන් පත් ව බොහෝ දවසක් පඤ්චකාම සැප නම් මේ යයි නොදත් බෝධිසත්වයන්, තමාගේ රූපයෙන් ද, ශබ්දයෙන් ද, ස්ප්‍රෂ්ටව්‍යයෙන් ද යි යනාදී පස්කම්, ගුණයෙන් බැඳ ගෙන, වනයෙහි ලෝභ ඇතත්හු මල පසකින් බැඳ ගත් කලක් පරිද්දෙන් තමා වසඟයෙහි ලා ගෙන, කාම රසයෙන් උමතු කර වුව. ඒ රස දත් බෝධිසත්ව තෙම, ''මෙවැනි රසයක් විඳිතොත් මා මුත් අනික් සෙස්සවුන් විඳිනේ නම් කිමෙක්ද''යි දුටු දුටු පුරුෂයන් කෙරෙහි ඊර්ෂ්‍යාව උපන්නේ ය. ඉක්බිති ඒ රාජ කුමාර තෙම මේ කාමරසය මා මුත් අනික් පිරිමියෙක් නොවිඳුවයි යන ලෝභයෙන් තියුණු කඩුවක් අතින් ගෙන දුටු දුටු පිරිමින් මරා දෙකඩකරමින් ඇවිදින්ට වන්නේ ය.

(පන්සිය පනස් ජාතක පොත, ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, සංස්)

(ලකුණු 28 යි)

02. "<u>අමාවතුරෙහි</u> ඇතැම් කතා පුවත් ඉදිරිපත් කොට ඇත්තේ මහජනයා පීඩාවට පත් කළ බමුණු දහමත්, එය අනුදත් රජුන්ගේ නො දැහැමි ක්‍රියා කලාපය හා එහි ආදීනවත් විවේචනය කිරීම සඳහා ය." නිර්දේශිත කතා පුවත් ඇසුරෙන් කරුණු පහදන්න.

03. අවස්ථා නිරූපණයේ දී විද්‍යාචක්‍රවර්තීන් විසින් <u>බුත්සරණෙහි</u> භාවිත කරන ලද රචනා උපක්‍රම නිදසුන් සපයමින් සාකච්ඡා කරන්න.

04. "උපමා බහුල සරල බස් ආරකින් ගැමි ජනයාට දහම් කරුණු පැහැදිලි කිරීමට <u>සද්ධර්මරත්නාවලි</u> කතුවර ධර්මසේන හිමි සමත් වී ය" මේ අදහස සනිදර්ශනව පැහැදිලි කරන්න.

05. "<u>පන්සිය පනස් ජාතක පොත</u>, සදාචාර ධර්ම වර්ධනයත් පුළුල් ජීවිතාවබෝධයත් ලබා දෙන, සාර්වත්‍රික අගයෙන් යුතු සාහිත්‍ය කෘතියකි" නිර්දිෂ්ට කථා ඇසුරින් විග්‍රහ කරන්න.

06. සාමාන්‍ය පාඨක ජනයා අරමුණු කොට ගනිමින් තත්කාලීන ගද්‍ය රචනා රීති වෙනස් වූ අයුරු දඹදෙණි, කුරුණෑගල සාහිත්‍යය ඇසුරින් සාකච්ඡා කරන්න.

(02 සිට 06 දක්වා ප්‍රශ්නවලට ලකුණු 18 බැගිනි)